## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.

-------------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සන්සන්දනය කිරීමේදී ණයහිමි ගිණුමේ හා සමුච්චිත අරමුදල් ගිණුමේ රු. 90,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගත් රු. 118,149 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම හරහා ප්‍රාග්ධනිත කර නොතිබූ බැවින් වර්ෂයේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු. 117,820 ක් වටිනාකමැති ලීබඩු හා යන්ත්‍රෝපකරණ වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ නමුත් එම වත්කම් වෙන්දේසි කිරීමට පෙර වත්කම් ගිණුම් වලින් කපාහැර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 10,667,461 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) වැය ශීර්ෂ 04 කට අදාලව වැය ලෙජරයේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂයන් සන්සන්දනය කිරීමේදී රු. 42,876 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

-------------------

2015 මැයි 15 දින විසුරුවා හරින ලද ප්‍රාදේශීය සභාවේ සභිකයින් සඳහා 2015 මැයි මාසයේ සභික දීමනා වශයෙන් රු. 300,000 ක් ගෙවා තිබූ නමුත් ප්‍රතිපූර්ණය වී තිබුණේ සභිකයින්ට හිමි දින 15 වැටුප වන රු. 150,000 ක් පමණි. මේ අනුව රු. 150,000 ක අලාභයක් සහා අරමුදලින් දරා තිබීමෙන් වැටුප් වියදම රු. 150,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර, ප්‍රාදේශීය සභාව විසින් මන්ත්‍රීවරුන්ගෙන් අයකරගත යුතු රු. 150,000 ගිණුම් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීත රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව.<br>----------------------------------------- | අනුකූල නොවීම්.<br>------------------- |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371(2) (අ)හා (ඇ) | 2012, 2013 හා 2014 වර්ෂයන්ට අදාලව රු. 1,175,518 ක අත්තිකාරම් නොපියවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, 2015 මැයි මස දින 03 ක වීථි නාට්‍ය කණ්ඩායමට සංයුක්ත දීමනාව වශයෙන් ලබාදී තිබූ රු. 24,430 ක අත්තිකාරම් 2015 ඔක්තෝබර් 21 දින වනවිටත් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 570 සහ 571 | ඉකුත් වූ තැන්පතු නියාදනය කල යුතු වුවත්, රු. 874,811 ක් වටිනාකමැති තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක PE/01/01 හා 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | ග්‍රාමීය ප්‍රදේශන්හි A ශ්‍රේණියේ මාර්ග වල ව්‍යාපාරික ප්‍රදේශ තුල විදුලි කණුවක උපරිමය වොට් 110 අධිපීඩන සෝඩියම් වේපර් ලාම්පු යෙදිය හැකි නමුත් ඒ පිළිබඳව නොසලකා රු. 134,140 ක් වටිනාකමැති වොට් 250 ක්‍රෝබා වීථි පහන් කට්ටල 25 ක් ලබාගෙන ඉන් 20 ක් සවි කර තිබුණි. තවද, වීථි පහන් සවි කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇති කරගත් එකඟතාවයද විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ඇ) | සබරගමුව පළාත් සභා සහ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 01/2010 හා 2010 නොවැම්බර් 16 දිනැති චක්‍රලේඛය | අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් කිසිඳු සේවකයෙකු ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන බඳවා නොගත යුතු බව දක්වා තිබියදී ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 23 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 5,395,358 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,742,653 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 1,347,295 කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 20 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් වල අඩුවීම හා පුනරාවර්තන වියදම්හි වැඩිවීමයි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 7,545 | 7,491 | 10,020 |
| බදු කුලී | 1,929 | 1,827 | 1,642 |
| බලපත්‍ර ගාස්තු | 388 | 519 | 21 |
| වෙනත් ආදායම් | 56,230 | 39,524 | 14,357 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදු කුලී සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන් රැස්කල ආදායම, අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 22, සියයට 04, සියයට 16, සියයට 34, සියයට 50 හා සියයට 38 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

--------------

සභා බල ප්‍රදේශයේ 2015 සැප්තැම්බර් 31 දිනට රු. 3,000 ට වඩා හිඟහිටි වරිපනම් බදු ආදායම රු. 1,867,646 ක්වූ අතර, එයින් රු. 7,000 කට වඩා වැඩි හිඟයක් පවතින වරිපනම් බදුහිමියන් 60 දෙනෙකුගෙන් රු. 706,508 ක ශේෂයක් අයවීමට තිබුණි.

2.3.4 බදුකුලී

--------

සභාව සතුවූ කඩකාමර වලින් මාර්ග පුළුල් කිරීම, නගර සංවර්ධනය වැනි හේතුවෙන් කඩා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වී ඇති අංක 11, 12 හා 13 යන කඩකාමර තුන පසුගිය වසර බදුගත් බදුකරුට ලබා දී තිබූ නමුත් ගිවිසුම් ගතවී නොතිබූ අතර, සභාවේ අංක 04, 01, 12A, 13 වශයෙන් වන කඩකාමර සඳහා රු. 161,709 ක කුලී ආදායම් හිඟව පැවතුණි.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ අක්කර බදු සත්‍යාක්ෂණයක් සිදුකර ලේඛණ යාවත්කාලීන කර නොතිබූ අතර, රු. 300 ට වඩා හිඟ අක්කර බදු ඒකක 71 කින් රු. 66,373 ක් අයවීමට තිබුණි.

(ආ) ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ව්‍යාපාර සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, සභා බල ප්‍රදේශය තුල ව්‍යාපාර ආයතන, කර්මාන්ත, වෙළඳසැල් සම්බන්ධයෙන් හඳුනාගැනීමෙන් තොරව උක්ත බදු හා ගාස්තු වශයෙන් අයකරනු ලබන වටිනාකම් පමණක් ලේඛණගත කර තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාල බලපත්‍ර ලබාගෙන ප්‍රදර්ශනය කල දැන්වීම් පුවරු ආයතන 19 ක් මඟින් රු. 143,350 ක මුදලක් පමණක් අයවී තිබූ අතර, සභාවේ විධිමත් අනුමැතිය ලබා ගැනීමකින් තොරව අති විශාල ප්‍රමාණයේ බැනර් 04 ක් ප්‍රදර්ශනය කර තිබුණි.

(ඈ) පැල්මඩුල්ල සතිපොල සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 17 දිනැතිව සිදු කරන ලද සතිපොල සමීක්ෂණයට අනුව ස්ථිර වෙළඳුන් හා මහ දෙපස වෙළඳුන් 186 ක් වෙළඳාමේ නියුක්තව සිටින බවත්, එදින ආදායම රු. 18,060 ක්වූ බව සඳහන් වුවත් ආදායම් රැස් කරනු ලබන නිලධාරීගේ වාර්තා අනුව 2015 ජනවාරි සිට ඔක්තෝබර් 10 දින දක්වා පොළ බදු ආදායම රු. 11,000 ත් රු. 16,000 ත් අතර ආදායමක් රැස් කර ඇති බව නිරීක්ෂණය විය.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

2014 අගෝස්තු සිට මුද්දර ගාස්තු ලැබී නොමැති අතර, උසාවි දඩ ලෙස පැල්මඩුල්ල අධිකරණයෙන් 2014 ඔක්තෝබර් මාසයෙන් පසුවද, රත්නපුර අධිකරණයෙන් 2014 ජනවාරි මාසයෙන් පසුවද ආදායම් ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් සිට 2013 දෙසැම්බර් දක්වා පොදු වෙළඳපල ගවමස් වෙළඳසැලේ හිඟ ජල බිල්පත් වලට අදාල මුදල් බදුකරුගෙන් අයකර ගැනීම හෝ ඇප මුදල් මඟින් හිලව් කර ගැනීමට හැකියාව තිබියදී ඒ පිළිබඳව නොසලකා අදාල ජල බිල්පත සඳහා 2015 ජූලි 27 දින සභා අරමුද මඟින් රු. 83,375 ක් ගෙවා

තිබුණි. මෙම ස්ථානය සඳහා වෙනම ජල මනුවක් සවි කිරීමේ හැකියාව තිබියදී ඒ පිළිබඳව සභාව නොසලකා හැර තිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාමික නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායක මුදල් මාසිකව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතු බව දක්වා තිබියදී සභාව විසින් 2010 අගෝස්තු මස සිට මෙම මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2015 මැයි 31 දින වනවිට රු. 3,764,210 ක හිඟ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) මාරපන උප කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය මඟින් බැංකුගත නොවූ පිළිවෙලින් රු. 8,915 ක් හා රු. 517,447 ක්වූ මුදල් හා චෙක්පත් සහ 2003 වර්ෂයේ සිට උපලබ්ධි නොවූ රු. 109,562 ක්වූ චෙක්පත් හා සොයාගත නොහැකි ලෙස බැංකු සැසඳුමේ සඳහන් කර ඇති රු. 259,296 සම්බන්ධ බැංකු සැසඳුමේ පැවති අඩුපාඩු නිරවුල් කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) සේවක ණය ලේඛණය අනුව ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් රු. 160,150 ක් අය කර ගැනීමට නොහැකිව පැවතුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ අයකර ගත් රු. 40,681 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල මාසිකව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කල යුතු වුවත්, එම බදු මුදල විවිධ තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය කාර්යය මණ්ඩල සාමාජිකයින් 04 දෙනෙකු වෙත නිදහස් කිරීමට ඇති රු. 12,098 ක්වූ සේවක ඇප නිදහස් නොකර දිගින් දිගටම සභාව වෙත රඳවාගෙන තිබුණි.

(ඇ) ණයහිමි ලේඛණය අනුව ණයහිමියන්ට මුදල් නොගෙවීම හෝ ලේඛණ නඩත්තු නොවීම මත පසුගිය වර්ෂයන්ට අදාලව රු. 693,447 ක ශේෂයක් නිරීක්ෂණය විය.

3.3 කොන්ත්‍රාත් පාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ අයවැය මඟින් කර්මාන්ත 16 ක් ඉටු කිරීම සඳහා යෝජනා වී සම්මතවී තිබුණද, ඊට පටහැනිව වෙනත් කර්මාන්ත 12 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගමින් ගමට දොරින් දොරට වැඩ සටහන මඟින් සිදු කරන ලද ඉදිකිරීම් අවසන් කර්මාන්ත 27 ක් සඳහා රු. 15,063,154 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද නාරංගොඩ නිදන්ගල බෝධි විහාර අසලින් කුඩා පාලමක් ඉදිකිරීම් කර්මාන්තය ප්‍රයෝජනයට ගතහැකි අන්දමින් සකසා නොතිබූ අතර, ඒ සඳහා දරණ ලද වියදම් නිශ්කාර්යය වියදමක් බවද නිරීක්ෂණය විය

3.4 වාහන පාලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් අංක SG PD – 7614 හා SG LF – 4824 දරණ කැබ් රථ දෙකේම දීර්ඝ කාලයක සිට මයිලෝ මීටරය ක්‍රියාවිරහිතවී ඇති බව සඳහන් කරමින් රියදුරුගේ ස්ව තක්සේරුව මත ඉන්ධන තුලනය කිරීම සිදුකර තිබුණි. අදාල අළුත්වැඩියා කර ගැනීමටද කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර, කැබ් රථ වල සම්පූර්ණ ඉන්ධන ධාරිතාවය කොපමණද යන්න පැහැදිලිව තහවුරු කර ගැනීමකින් තොරව ඉන්ධන මිලදී ගෙන තිබු ණි.මේ අනුව ධාවන සටහනෙහි ඉන්ධන තුලනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි අතර, සමාලෝචිත වර්ෂය තුලදී රු. 549,120 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 5677 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) අංක 49-8876 දරණ ට්‍රැක්ටරය අළුත්වැඩියාව සඳහා 2014 ඔක්තෝබර් 08 දින යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාරදී ඇති නමුත් 2015 ඔක්තෝබර් 22 දින වනවිටත් අදාල අළුත්වැඩියාව සිදුකර නොතිබුණි.

(ඇ) ලියාපදිංචි අංක RD 5932 දරණ ට්‍රැක්ටර් රථය කසල වලට පෙරලී අනතුරක් සිදු වී තිබූ අතර, එම අනතුරින් ට්‍රැක්ටරයට සිදු වූ හානිය අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු රු. 261,825 ක් විය රක්ෂණ සමාගම විසින් රක්ෂණ වන්දි ලෙස රු. 197,993 ක් පමණක් ගෙවීමට එකඟවී තිබූ බැවින් රු. 63,832 ක පාඩුවක් සභා අරමුදලට ඇති වීමේ අවදානමක් නිරීක්ෂණය විය.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

අංක 53-5635 හා WP PF – 7484 දරණ කැබ් රථ හා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් සභාව වෙත පවරා දී තිබූ ටිපර් රථය සභාවට ලබාදුන් ආයතන වලින් සභාවේ නමට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබූ අතර, ලියාපදිංචි අංක 53-5635 දරණ සභා භූමියේ ගාල් කර තිබූ කැබ් රථය දිරා යමින් පැවතුණි. තවද, ටිපර් රථය නිෂ්කාර්යයව ගාල් කර තිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

-----------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 43 කට අදාලව රු. 1,555,500 ක මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක නොයොදා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ අංක 504 යටතේ හා 609 යටතේ රු. 2,760,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ නමුත් රු. 11,350 ක් පමණක් වැය දරා තිබුණි. තවද, වැය ශීර්ෂ අංක 609-1 යටතේ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු. 300,000 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,250 ක් වටිනා පොත් 05 ක් පමණක් මිලදී ගෙන තිබුණි. මේ අනුව අයවැයගත ප්‍රමාණයෙන් 0.4 % ක් පමණක් වැය දරා තිබීම තුල අයවැය කළමනකාරණයේ විශාල දුර්වලතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී වැය ශීර්ෂ 21 කින් වැය ශීර්ෂ 25 කට රු. 7,994,500 ක ප්‍රතිපාදන මාරු කර ඇති නමුත් ඒ සඳහා සභා තීරණයක් හෝ කමිටු නිර්දේශයක් ලබාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

--------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය